*සැ. යු.* - 2011.08.19 වැනි දින පළවූ අංක 1,720 දරන ගැසට් පත්‍රයේ I-II (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,721 - 2011 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2011.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | -- |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 576 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | -- |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | -- |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | -- |
| රජයේ නිවේදන ... ... ... | 576 |
| මිල පාලන දැන්වීම් ... ... ... | -- |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | -- |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | -- |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 577 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 586 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | -- |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2011 අංක 367

DIRF/RECT/272/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම් සඳහන් මහත්වරුන් දක්වා ඇති දිනයන්හිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල සේනාවේ කපිතන් හා ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එම දිනයන්හි සිටම බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

*කෘෂි නිලධාරීන් (කපිතන්) 2010.09.30 වැනි දින සිට :*

දිසානායක මුදියන්සේලාගේ හේමලාල් චම්පික කුමාරතිලක
දිසානායක මුදියන්සේලාගේ සුරංග උදය බණ්ඩාර
විල්ලෝරගේ තුෂාර උපශාන්ත පෙරේරා

*කෘෂි නිලධාරීන් (ලුතිතන්) 2010.09.30 වැනි දින සිට :*

බ්‍රැන්ඩි ගම්පලගේ කසුන් එරංද
ජගත් ප්‍රියන්ත විජේතුංග
වනසිංහ ආරච්චිගේ දොන් රුවන් සම්පත් අධිකාරි

*කෘෂි නිලධාරී (ලුතිතන්) 2010.10.15 වැනි දින සිට :*

හල්ගහ ගමරාලලාගේ ජනක ප්‍රසාද් කුමාර

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජුලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08-705

2011 අංක 368

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් මහත්ම/මහත්මීන් දක්වා ඇති දින සිට ජ්‍යෙෂ්ඨත්වය අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරියට පත්කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකර ඇත :

(අ) *2010 සැප්තැම්බර් මස 15 වැනි දින සිට දෙවන ලුතිතන් වශයෙන් :*

ගොඩිගමගේ නදීෂා ප්‍රියදර්ශනී මෙනවිය
මහරූෆ් නිහාල් හුසේන් මහතා
අබ්දුල් ගෆූර් මුහම්මදු රාෆි මහතා
උලපනයලාගේ අනූෂා තරංගනී ගුණසිංහ මහත්මිය

(ආ) *2010 දෙසැම්බර් මස 05 වැනි දින සිට තාවකාලික කපිතන් වශයෙන් :*

නානායක්කාර වර්ණකුලසූරිය ඉලේකුට්ටිගේ ජීවනී මධුකා
දැසමන් ප්‍රනාන්දු මෙනවිය
වීරසිංහ පතිරණගේ නිලූක දිල්රුක් වීරසිංහ මහතා
දේවගිරි කපුරාලලාගේ කමලතිලක දේවගිරි මහතා
විපුල කුලතුංග මහතා
නානායක්කාර මාබොටුවන අප්පුගේ දූලාරි දීපිකා මහත්මිය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011
කොළඹදී ය.

08-613

# රජයේ නිවේදන

**මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද සුවාමි දේවාලයේ වාර්ෂික උත්සවය**

මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද සුවාමි දේවාලයේ වාර්ෂික උත්සවය 2011.08.23 වැනි දින පෙ. ව. 8.00ට කොඩිය එසවීමෙන් ආරම්භ වී ඉන්පසු 2011.09.12 වැනි දින පෙ. ව. 10.00ට දිය කැපීමේ උත්සවය පැවැත්වේ. පසුව එදින 9.00ට කොඩිය පහළ හෙළීමෙන් උත්සවය අවසන් වේ.

1949.05.27 වැනි දින අංක 5886 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කොන්දේසි මෙම කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනුම් දෙමි.

උ. උදයශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්.

2011 අගෝස්තු මස 08 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පෝරතිවු පත්තු.

08-657

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

පශු ඖෂධ පාලන අධිකාරියේ දැන්වීමයි

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙකී පනත යටතේ ස්ථාපිත පශු ඖෂධ පාලන අධිකාරි මණ්ඩලය පශු ඖෂධ ලියාපදිංචි කිරීම සඳහා වසර තුනක වලංගු කාලයක් ද එන්නත් සඳහා දැවුරුදු කාලපරිච්ඡේදයක් ද ලබා දීමට තීරණය කර ඇත. තව ද, කිසිදු ආකාරයේ වලංගු කාලපරිච්ඡේදයක් ලබා දී නොමැති, දැනටමත් ලියාපදිංචි කොට ඇති පශු ඖෂධයන්හි ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මෙම දින සිට සයමසක සහනදායි කාලපරිච්ඡේදයක් ලබා දෙනු ලැබේ.

02. මෙම තීරණය සම්බන්ධයෙන් තවදුරටත් විස්තර ලේඛකාධිකාරි, පශු ඖෂධ පාලන අධිකාරිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය, යන ලිපිනයෙන් ලබා ගත හැක.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 13,
පේරාදෙණිය.

08-622

**2011 වාර්ෂික තොග ගණන් ගැනීම හා හරි වැරදි බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියලුම බෙහෙත් ගබඩා වසා තැබීම**

වර්ෂ 2011 දෙසැම්බර් මස 01 වැනි දින සිට 2011 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) තොග ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියලුම ගබඩා වසා තබනු ඇත.

අත්‍යවශ්‍ය හදිසි වෛද්‍ය සැපයීම් සහ අන්තරාදායක ඖෂධ හැර වෙනත් කිසිම තොග නිකුත් කිරීමක් සඳහා එම කාල පරිච්ඡේදය තුළ දී අයදුම්පත් භාර නොගන්නා බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරුන්, ශික්‍ෂණ රෝහල් අධ්‍යක්‍ෂවරුන්, මහ රෝහල් අධ්‍යක්‍ෂවරුන්, මධ්‍යම රජය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්‍ෂරුන්, ආරක්‍ෂක අංශ වල කාර්යභාර වෛද්‍ය නිලධාරීන් (ගුවන්, නාවික, පාබල සහ පොලීසිය), විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානීන් හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය කමල් ජයසිංහ,
අධ්‍යක්‍ෂ,
වෛද්‍ය සැපයීම් අංශය.

2011 අගෝස්තු මස 09 වැනි දින,
අංක 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

08-624

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්‍ෂණ ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2009 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

*(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත.)*

| | | *2009* | *2008* |
|---|---|---|---|
| | | *රු.* | *රු.* |
| | | *ශු. පො. අ.* | *ශු. පො. අ.* |
| **ප්‍රවර්තන නොවන වත්කම්** | සටහන - 02 | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | 2,954,031 | 2,840,845 |
| පරිගණක | | 1,057,093 | 835,100 |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | | 10,693,129 | 17,352,614 |
| වැද්දුම් හා සවිකිරීම් | | 66,194 | 75,885 |
| රසායනාගාර මෙවලම් | | 737,547 | 1,125,833 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | | 329,959 | 386,298 |
| | | 15,837,953 | 22,616,576 |
| ආයෝජන - පැවරුම් අරමුදල | | 1,753,161 | 1,442,880 |
| | | **17,591,113** | **24,059,456** |
| **ප්‍රවර්තන වත්කම්** | | | |
| ආයෝජන | සටහන - 03 | 15,771,444 | 14,701,408 |
| කාර්ය මණ්ඩල ණය | සටහන - 04 | 1,544,690 | 1,491,803 |
| අත්තිකාරම් ගිණුම | | 2,042,573 | 2,228,722 |

| | | 2009<br>රු.<br>ශ. පො. අ. | 2008<br>රු.<br>ශ. පො. අ. |
|---|---|---|---|
| වෙනත් ලැබීම් | සටහන - 05 | 102,700 | 121,161 |
| කාල තැන්පතුවල ආයෝජන | | 8,250,000 | 6,750,000 |
| බැංකු ශේෂ | සටහන - 06 | 2,285,736 | 3,440,809 |
| | | 29,997,143 | 28,733,903 |
| **මුළු වත්කම්** | | **47,588,256** | **52,793,359** |
| ප්‍රාග්ධනයෙන් මූල්‍ය සම්පාදනය කරන ලද | | | |
| වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 6,052,753 | 4,826,865 |
| වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 2,941,550 | 3,760,380 |
| ත්‍යාග හා පරිත්‍යාග | | 9,056,119 | 17,305,958 |
| | | **18,050,422** | **25,893,203** |
| සංචිත | | | |
| ආදායම් හා වියදම් ගිණුම | | 14,358,964 | 10,894,488 |
| සීමාකරන ලද අරමුදල් | | | |
| පැවරුම් අරමුදල | | 1,818,380 | 1,508,100 |
| පර්යේෂණ ප්‍රදානයන් | සටහන - 07 | 8,009,566 | 9,513,088 |
| ආයතන සංවර්ධන අරමුදල | | 879,249 | 676,214 |
| 2010 විද්‍යාපති පර්යේෂණ ව්‍යාපෘති | | 655,000 | 1,830,000 |
| | | **11,362,195** | **13,527,402** |
| ප්‍රවර්තන බැරකම් | | | |
| උපචිත වියදම් | | 1,897,193 | 981,103 |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | සටහන - 08 | 1,266,873 | 1,167,414 |
| ආපසු ගෙවිය යුතු රසායනාගාර තැන්පතු | | 594,000 | 300,000 |
| ආපසු ගෙවිය යුතු වෙනත් තැන්පතු | | 58,610 | 29,750 |
| | | **3,816,675** | **2,478,266** |
| | | **47,588,256** | **52,793,359** |

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි විසින් සකස් කොට සහතික කරන ලදී.

පාලක මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් :

අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි.

**ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2009 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම්**

*(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත.)*

| | 2008<br>රු. | 2008<br>රු. |
|---|---|---|
| ආදායම | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 27,850,000 | 30,000,000 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රජයේ ප්‍රදානය | 1,000,000 | 1,600,000 |

| | | *2008* | *2008* |
|---|---|---|---|
| | | *රු.* | *රු.* |
| ප්‍රදානය කරන ලද වත්කම් ක්‍රමක්ෂය කිරීම | | 9,952,782 | 9,467,795 |
| පර්යේෂණ ප්‍රදානයන් | සටහන - 09 | 3,364,376 | 3,564,025 |
| ඉපැයූ ආදායම | සටහන - 10 | 4,796,732 | 3,036,179 |
| පොලී ආදායම | | 1,278,271 | 825,232 |
| වෙනත් ආදායම් | සටහන - 11 | 246,875 | 358,723 |
| | | **48,489,036** | **48,851,955** |
| අඩුකළා : වියදම් | | | |
| පුද්ගල පඩිනඩි | සටහන - 12 | 9,142,526 | 8,141,119 |
| ගමන් වියදම් | | 239,073 | 431,332 |
| සැපයුම් | සටහන - 13 | 6,701,508 | 6,326,047 |
| නඩත්තු වියදම් | සටහන - 14 | 5,202,322 | 5,099,034 |
| ගිවිසුම්ගත සේවා | සටහන - 15 | 10,946,549 | 9,881,231 |
| වෙනත් පුනරාවර්තන වියදම් | සටහන - 16 | 2,586,626 | 1,137,438 |
| ආයතන සංවර්ධන අරමුදල | | 160,500 | 407,775 |
| ක්ෂය වීම් | | 10,089,022 | 9,467,795 |
| | | **45,068,126** | **40,891,772** |
| වියදමට වැඩි ආදායම් අතිරික්තය | | **3,420,909** | **7,960,183** |
| **ආදායම් හා වියදම් විසර්ජන ගිණුම** | | | |
| ආදායම් හා වියදම් ගිණුමෙන් ඉ. ගෙ. ශේෂය | | 3,420,909 | 7,960,183 |
| ආදායම් හා වියදම් ගිණුමේ ඉ. ගෙ. ශේෂය | | 10,894,488 | 2,979,654 |
| කලින් වර්ෂය සම්බන්ධයෙන් ගැලපීම් | | 43,567 | (45,349) |
| **ශේෂ පත්‍රයට ඉ/ගෙ ශේෂය** | | **14,358,964** | **10,894,488** |

**ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *රු.* | *රු.* |
|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | 3,420,909 | |
| එකතුකළා : අරමුදල් සංචලනය නොමැති අයිතම සඳහා ගැලපීම | | |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 99,459 | |
| ආයෝජනයෙන් පොලිය | (1,278,217) | |
| ආයතන සංවර්ධන අරමුදලට මාරු කිරීම | 160,500 | |
| වත්කම් කපා හැරීම | | |
| ක්ෂයවීම | | |
| පූර්ව වර්ෂ ගැලපීම් | 136,240 | |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 2,538,891 | |
| ලැබිය යුතු ප්‍රමාණයන්හි අඩුවීම | 151,723 | |
| ගෙවිය යුතු ප්‍රමාණයන්හි වැඩිවීම | 1,238,950 | |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | **3,929,564** |

| | රු. | රු. |
|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරීත්වයන්ගෙන් මුදල් ප්‍රවාහයන් | | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | (3,266,830) | |
| ආයෝජනවල වැඩිවීම | (1,380,316) | |
| ආයෝජනවලින් පොළිය | 1,278,217 | |
| | | **(3,368,929)** |
| මූල්‍ය ක්‍රියාකාරීත්වයන්ගෙන් මුදල් ප්‍රවාහයන් | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 2,110,000 | |
| සීමාකරන ලද අරමුදල් | 2,325,708 | |
| | | **(215,708)** |
| | | 344,927 |
| සමරූපී මුදල්වල ශුද්ධ වැඩිවීම | | |
| කාලසීමාව ආරම්භයේදී මුදල් හා සමරූපී මුදල් | | 10,190,809 |
| කාලසීමාව අවසානයේදී මුදල් හා සමරූපී මුදල් | | **10,535,736** |

**ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය**

කොළඹ විශ්වවිද්‍යාලය

1. 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

1.1 *ගිණුම් තැබීමේ පදනම*

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ වත්කම් අත්පත් කරගත්, ගනුදෙනු බැරකම් සිදු වූ සහ අරමුදල් ලබාගත් දිනවලට පැවැති අගයන් අනුව හුවමාරු කිරීම් වාර්තා කිරීම සිදු වන අයුරින්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබ ඇති පොදුවේ පිළිගැනෙන ගිණුම් මූලධර්මවලට හා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමේ ඓතිහාසික පිරිවැය පදනම මත ය.

1.2 *විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම*

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සියල්ල ගිණුම්ගත කර ඇත්තේ ගනුදෙනු සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාත අනුව ය. එවැනි ගනුදෙනු පියවීමෙන් සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදු වන මූල්‍ය වත්කම්වලින් හා බැරකම්වලින් ඇති වන ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශනයේදී පිළිගනු ලැබ ඇත. විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදුවන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍ර දිනට පවත්නා විනිමය අනුපාත අනුව පරිවර්තනය කරනු ලැබේ.

1.3 ආදායම් පිළිගැනුම

(i) *රජයේ ප්‍රදාන (පුනරාවර්තන)*

පුනරාවර්තන වියදම හා සම්බන්ධ රජයේ සියලු ප්‍රදානයන් පිළිගනු ලබන්නේ වෙන් කරනු ලබන අවස්ථාවේ දී ය.

(ii) *රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන)*

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ මිලදී ගැනීම හා සම්බන්ධ ප්‍රදානයන්, විලම්බිත ආදායම වශයෙන් ජංගම නොවන බැරකම්වලට ඇතුළත් වන අතර ඒවා අදාළ වත්කම්වල අපේක්ෂිත ආයු කාලය තුළ සෘජු රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

(iii) *පාඨමාලා ගාස්තු*

පාඨමාලා ගාස්තු ගණන් ගනු ලබන්නේ ඒවා පැවැත්වෙන කාල සීමාව තුළ ය. විවිධ මූල්‍ය කාල සීමාවන්ට වෙන් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නැති අවස්ථාවලදී මුදල් පදනමක් මත ආදායම් වශයෙන් ගාස්තු ගණන් ගනු ලැබේ.

(iv) *ආයෝජන ආදායම*

ආයෝජන ආදායම උපචිත පදනමක් මත ගණන් ගනු ලැබේ.

1.4 *වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම්*

*දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ*

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ වාර්තා කරනු ලබන්නේ ඒවායේ කවර හෝ ආනුෂංගික වියදම් ද සමඟ මිලදී ගැනීමේ පිරිවැයට ය. වත්කම් ප්‍රකාශ කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය වීම අඩුකොට පිරිවැයට ය. ප්‍රදානයන් වශයෙන් ලැබුණු වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට අගය කරනු ලැබ ඇත.

*ක්ෂය වීම*

වත්කමක පවත්වාගෙන යෑමේ ප්‍රමාණය එයින් ලබාගත හැකි ප්‍රමාණයට වහාම ලියා අඩු කරනු ලබන අතර එවැනි අඩු කිරීමක් වියදමක් වශයෙන් වහාම ගණන් ගනු ලැබේ.

*බැහැර කිරීමේදී ලාභය හෝ පාඩුව*

බැහැර කිරීමේදී ලාභ සහ පාඩු නිගමනය කරනු ලබන්නේ ලැබෙන ප්‍රමාණය පවත්වාගෙන යෑමේ ප්‍රමාණය සමඟ සැසඳීමෙනි. ඒවා ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් වේ.

*පසුව ඇතිවන පිරිවැය*

පසුව ඇතිවන පිරිවැය වත්කමේ පවත්වාගෙන යෑමේ ප්‍රමාණයට ඇතුළත් කරනු ලැබේ නැතහොත්, අයිතමවල අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබීමට හැකියාවක් ඇත්නම් සහ අයිතමවල පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණක්, සුදුසු පරිදි වෙන ම වත්කමක් වශයෙන් ඇතුළත් කරනු ලැබේ. අනෙකුත් සියලු ම අලුත්වැඩියාවන් හා නඩත්තු කිරීම්, ඒවා සිදු වන මූල්‍ය කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශනයෙන් අඩු කරනු ලැබේ.

*ක්ෂය වීම*

මිලදී ගත් දිනයන් දන්නා වත්කම්වල ක්ෂය වීම දක්වනු ලබන්නේ සම්පූර්ණ කරන ලද මාස ගණනකට හෝ මිලදී ගත් දිනයේ සිට එවැනි වත්කම් භාවිත කරනු ලැබූ මාස ගණනට සමානුපාතිකවය. මිලදී ගත් නියම දිනය නොදන්නා වත්කම් සම්බන්ධයෙන් ක්ෂය වීම ගණන් ගනු ලබන්නේ ඒවා මිලදී ගත් සම්පූර්ණ වර්ෂයටය. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයේදී වත්කම්වල මාස ගණනට සමානුපාතිකව විකිණීමේ/බැහැර කිරීමේ වර්ෂය තුළ ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

පහත දැක්වෙන පරිදි සියලු ම දේපළවල සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් තුළ පිරිවැය කපා හැරීම සඳහා ක්ෂයවීම අඩු කරනු ලැබේ. :

*ක්ෂය කිරීමේ අනුපාත*

| | |
|---|---|
| වැද්දුම් සහ සවිකිරීම් | වර්ෂයකට 10% |
| කාර්යාල භාණ්ඩ හා උපකරණ | වර්ෂයකට 10% |
| පරිගණක | වර්ෂයකට 20% |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | වර්ෂයකට 20% |
| රසායනාගාර මෙවලම් | වර්ෂයකට 20% |
| පුස්තකාල පොත් සහ වාරසඟරා | වර්ෂයකට 20% |

1.5 *ලැබිය යුතු මුදල්*

ලැබිය යුතු මුදල් ප්‍රකාශ කරනු ලබන්නේ ඒවායින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ට ය.

1.6 *මුදල් හා මුදල්වල සාම්‍යයන්*

මුදල් හා මුදල් වල සාම්‍යයන් සමන්විත වන්නේ මුදල් හා බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන යන ඒවායිනි.

1.7 *මුදල් ප්‍රවාහ ප්‍රකාශනය*

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පරමාර්ථය සඳහා "වක්‍ර ක්‍රමය" භාවිත කරමිනි. මුදල් හා මුදල් සාම්‍යයන් සමන්විත වන්නේ මුදල් හා බැංකු ශේෂ හා කෙටි කාලීන තැන්පතු යනාදියෙනි.

1.8 *සේවක ප්‍රතිලාභ*

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ අනුපාතයන්ට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලැබේ. පනත යටතේ පාරිතෝෂික ගෙවීම් සඳහා සුදුසුකම් ලැබීම පිණිස සේවකයන් අවම වශයෙන් අවුරුදු පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වුව ද, සියලු ම සේවකයන් අඩු වශයෙන් අවුරුදු පහක් සේවයේ යෙදී සිටීමට අදහස් කරන්නේ ය යන උපකල්පනය මත සේවා නියුක්තිය ආරම්භයේ දී ම ප්‍රතිපාදන සලසනු ලැබේ.

*නිර්වචනය කරන ලද දායකත්ව සැලසුම් - විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල*

සේවකයෝ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ සාමාජිකයෝ වෙති. නිර්වචනය කරන ලද දායක සැලසුම්, විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදල යන අරමුදල්වලට කරනු ලබන දායකවීම්, සිදු කරන ලද වියදමක් වශයෙන් ආදායම් ප්‍රකාශනයේ ගණන් ගනු ලැබේ.

1.9 *තුලනාත්මක තොරතුරු*

තුලනාත්මක තොරතුරු ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 3ට අනුකූල වන පරිදි ය.

මගේ අංකය : සීඊ/සී/අයිබීඑම්බීබී/09/එෆ්/ඒ.
2010 අප්‍රේල් මස 26 වැනි දින,
අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛ තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 *විගණන විෂය පථය සහ මතය සඳහා පදනම*

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

*මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් මස 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) 1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් නිලධාරියෙකුහට දීමනා වශයෙන් 2009 වර්ෂයේ දී රු. 8,820ක් ගෙවා තිබුණි. මෙම දීමනා ගෙවීම රජයේ නීති රීතින්ට පටහැනි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා තිබුණ නමුත් එම ගෙවීම් අඛණ්ඩව සිදුකරමින් තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන දීමනාව සාවද්‍ය ලෙස වැටුපට එකතු කර ගණනය කිරීම නිසා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් වශයෙන් රු. 80,386ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය*

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 25,429,090 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 23,639,817ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණ රු. 28,850,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 3,420,909 ක අතිරික්තයකට පරිවර්තනය වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණ රු. 31,600,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු. 7,960,183 ක අතිරික්තයකට පරිවර්තනය විය.

3.2 *මෙහෙයුම් සමාලෝචනය*

3.2.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) සමාලෝචිත වර්ෂය තුළ විද්‍යාපති උපාධි පාඨමාලා 02ක් පවත්වා තිබුණි. ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 12ක් වූ අතර ඉන් එක් ශිෂ්‍යයෙකු පාඨමාලාව සඳහා නොපැමිණෙන බව දන්වා ඇති අතර තවත් ශිෂ්‍යයෙකු 2010 වර්ෂයේ දී පාඨමාලාව හැදෑරීමට අවසර ලබා ගෙන ඇත. උපාධිය සම්පූර්ණ කළ සංඛ්‍යාව 10ක් වූ අතර ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු. 362,232ක් විය. මෙය පෙර වර්ෂය හා සසඳන විට රු. 56,064ක වැඩිවීමක් විය.

(ආ) දර්ශනපති පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 15ක් වූ අතර 2009 වර්ෂය තුළදී එක් ශිෂ්‍යයෙකු පමණක් ලියාපදිංචි වී ඇත. 2009 වර්ෂයේ දී සිසුන් දෙදෙනෙකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 03-05 අතර විය.

(ඈ) දර්ශනශූරි පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 06ක්වූ අතර එක් ශිෂ්‍යයකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 03-05 අතර විය.

(ඇ) 2009 වර්ෂය අවසන් වන විට පශ්චාත් උපාධි පාඨමාලා හදාරා සම්පූර්ණ කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 35ක් වූ අතර එය දර්ශනපති, දර්ශනශූරි 03ක් ද ජෛව විද්‍යා විද්‍යාපති පාඨමාලාව 18 ක් ද සෛල හා අණුක ප්‍රතිශක්තිවේදී විද්‍යාපති පාඨමාලාව 14ක් ද වශයෙන් විය.

(ඉ) ක්ෂේත්‍ර 09ක් ආවරණය වන පරිදි පර්යේෂණ ව්‍යාපෘති 31ක් පවත්වා තිබුණි. ඉන් පර්යේෂණ 09 ක කටයුතු සම්පූර්ණ කර වාර්තා නිකුත් කර තිබුණි. පර්යේෂණ ව්‍යාපෘති 22ක කටයුතු කෙරීගෙන යමින් පැවතුණි.

(ඊ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්යවරු 20 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණු අතර ඔවුන් විසින් දේශන පැය 243.15ක් පවත්වා තිබුණි. මෙම බාහිර දේශකයින් සඳහා දරන ලද පිරිවැය රු. 176,012ක් වූ අතර දේශන පැයක පිරිවැය රු. 724ක් විය.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධ විභාග 13ක් පවත්වා ඇති අතර එම විභාග වෙනුවෙන් සිසුන් 55 දෙනෙකු පෙනී සිට ඇත. විභාග සියල්ලේම ප්‍රතිඵල 2009 වර්ෂය තුළ දී නිකුත් කර තිබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. දීමනා ගෙවීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

එස්. ස්වර්ණජෝති මයා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07,
2010 මැයි මස 05 වැනි දින.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඔබගේ අංක සීඊ/සී/අයිබීඑම්බීබී/09/එෆ්/ඒ හා 2010 අප්‍රේල් 26 දිනැති ඉහත වාර්තාව හා බැඳේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

මතය

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 *ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු*

(අ) අදාළ ගෙවීම සිදුකරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කළ චක්‍රලේඛවලට අනුවය. මෙම ගෙවීම සිදුකිරීම රජයේ නීතිරීතිවලට පටහැනි බවට චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අප වෙත ලැබී නොමැත. ගිය වසරවල විගණනයේ දී දැක්වූ අදහස් අනුව මේ ගැන නැවත උපදෙස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ඉල්ලා ඇති නමුත් තවමත් උපදෙසක් ලැබී නොමැත.

(ආ) අදාළ ගෙවීම සිදුකරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කළ චක්‍රලේඛවලට අනුවය. මෙම ගෙවීම සිදුකිරීම රජයේ නීතිරීතිවලට පටහැනි බවට චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අප වෙත ලැබී නොමැත. ගිය වසරවල විගණනයේ දී දැක්වූ අදහස් අනුව මේ ගැන නැවත උපදෙස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ඉල්ලා ඇති නමුත් තවමත් උපදෙසක් ලැබී නොමැත.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය*

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

එකඟ වේ.

3.2 *මෙහෙයුම් සමාලෝචනය*

3.2.1 *කාර්ය සාධනය*

(*අ*) 2008 වර්ෂයට සාපේක්ෂ 2009 වර්ෂය තුළ ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු. 56,064කින් වැඩි වී ඇත්තේ පරීක්ෂණ සඳහා යොදා ගන්නා ද්‍රව්‍යවල විකුණුම් මිල ඉහළ යාම සහ 2009 වර්ෂය තුළ වැඩි පරීක්ෂණ ප්‍රමාණයක් සිදුකිරීම නිසා ය.

(*ආ*) සහ (*ඇ*) දර්ශනපති/දර්ශනශූරී (MPhil/PhD) උපාධි පාඨමාලාව හදාරන සෘජු (direct) ශිෂ්‍ය සංඛ්‍යාව 14ක් සහ වක්‍ර (indirect) ශිෂ්‍ය සංඛ්‍යාව 6ක් විය. 2009 වසරේ දී එම පාඨමාලාව සඳහා නවක ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව එකකි. (වක්‍ර ශිෂ්‍ය ලෙස හැඳින්වෙන්නේ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී IBMBB ආයතනයේ පර්යේෂණ කටයුතු කරන ශිෂ්‍යයන්ය.)

දර්ශනශූරී (MPhil) උපාධිය සඳහා ඉල්ලුම් කරන ශිෂ්‍යයින් සහ දර්ශනපති (PhD) උපාධිය සඳහා ඉල්ලුම් කරන ශිෂ්‍යයින් සියල්ලම මෙම ආයතනයේ එම උපාධි සඳහා බලපවත්වන නියමයන් (Regulations) අනුව මුලින් ලියාපදිංචි කරන්නේ දර්ශනශූරී උපාධියටය. ඉන්පසු එම ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය සහ ඉල්ලුම් කිරීම අනුව දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචිය උසස් (Upgrade) කරනු ලැබේ. සමහරක් ශිෂ්‍යයෝ දර්ශනශූරී (MPhil) උපාධියෙන් පාඨමාලා අවසන් කරති.

මෙම උපාධි පාඨමාලාවල අවම සහ උපරිම කාල ශිෂ්‍යයින් පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව පාඨමාලා හදාරන්නේ ද යන්න අනුව වෙනස් වේ.

ඒ අනුව පාඨමාලා සඳහා කාලය මෙසේ ය :-

| | | *දර්ශනශූරී* | *දර්ශනපති* |
|---|---|---|---|
| පූර්ණ කාලීන | (අවම) | වසර 2 | වසර 2 මාස 9 |
| | (උපරිම) | වසර 3 1/2 | වසර 5 |
| දිගුකිරීම් | | වසර 2 | වසර 2 |
| දිගුකිරීම් සහිතව | උපරිම | වසර 5 1/2 | වසර 7 |
| අර්ධ කාලීන | (අවම) | වසර 3 | වසර 3 මාස 9 |
| | (උපරිම) | වසර 5 | වසර 7 |
| දිගුකිරීම් | | වසර 2 | වසර 2 |
| දිගුකිරීම් සහිතව | උපරිම | වසර 7 | වසර 9 |

නියමිත කාල සීමාව ඇතුළත ශිෂ්‍යයෙක් පාඨමාලාව සම්පූර්ණ නොකරයි නම් ඔවුන් පාඨමාලාව හැරගිය ලෙස සලකනු ලැබේ.

ශිෂ්‍යයෙක් තම පාඨමාලාව අවසන් කිරීමට විභාගය සඳහා ඉල්ලුම් කිරීමට අවම කාලය සම්පූර්ණ කළ යුතු අතර අවම කාලය සහ දිගු කිරීම් සහිතව උපරිම කාලය තුළ පාඨමාලාව නිම කළ යුතුය. එක් එක් පර්යේෂණවල ස්වභාවය අනුව ප්‍රතිපාදන ලැබීම් අනුව සහ ශිෂ්‍යයින්ට ගෙවීමක් නොලැබෙන අවස්ථාවල හෝ රැකියාවන්ගෙන් නිවාඩු ලබා ගත හැකි ආකාරය අනුව ලියාපදිංචිය පූර්ණකාලීන ද අර්ධකාලීනද යන්න නිගමනය කරනු ලැබේ.

2009 වසර වන විට පාඨමාලා හදාරමින් සිටින සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් තමන්ගේ අයිති පාඨමාලා කාලය තුළ සිටින අයවලුන්ය.

(*ඈ*) එකඟ වේ.

(*ඉ*) කෙරීගෙන යමින් පැවති ව්‍යාපෘති එසේ කෙරීගෙන යමින් පැවතියේ එම ව්‍යාපෘතිවල අවශ්‍ය කාලයන් ඉක්මවා නොමැති බැවිනි.

(*ඊ*) අභ්‍යන්තර කථිකාචාර්යවරුන් විසින් පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශන/නිබන්ධන/පැවරුම් ක්‍රියා පැය 755 න් පැය 4ක් පවත්වන්නේ 2010 වර්ෂයේ දී බව මුලින් සැපයූ තොරතුරුවල 4 වැනි පිටුවේ දක්වා ඇත. (ආචාර්ය ජගත් වීරසේන - සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පාඨමාලාව).

(*උ*) එකඟ වේ.

4. පද්ධති හා පාලන

අධ්‍යක්ෂ වෙත යොමුකරන ලද අඩුපාඩු, ආයතනයේ විගණන කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය වෙත යොමුකර ඔවුන්ගේ උපදෙස් පරිදි කටයුතු කර ඇත. දීමනා ගෙවීම් ගැන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් උපදෙස් ඉල්ලා ඇත.

මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්,
අධ්‍යක්ෂ.

පිටපත :
01. ආර්. එස්. විතානගේ මිය.
විගණන අධිකාරි,
රජයේ විගණන අංශය,
කොළඹ විශ්ව විද්‍යාලය
02. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
03. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
04. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
05. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය

08-586

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එන්(පීවීඑස්) 46307.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "එස් ඇන්ඩ් එස් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2006.05.31" දින සංස්ථාපිත සමාගමක් වන "එස් ඇන්ඩ් එස් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "එස් ඇන්ඩ් එස් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-689

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කුළියාපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ආසිරි සියවසේ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

2011.07.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එස්. රැකව විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2006.06.08 දින හා අංක 11749 දරන බැඳුම්කරය යටතේ (පහත පළමුවැනි උපලේඛනයේ සඳහන් පරිදි) සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දාවූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2010.03.31 දින හා අංක 2375 දරන බැඳුම්කරය යටතේ (පහත දෙවැනි උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු මුදල් ගෙවීම ආසිරි සියවසේ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්දෙලක්ෂ අසූපන්දහස් පන්සිය පනස්හයයි ශත හැට (රු. 52,85,556.60) ක මුදලක් 2011.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 52,85,556.60 ක මුදලට 2011.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ද වියදම් හා වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 11749 සහ 2375 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### පළමුවැනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, පිටිගල් කෝරලේ, ඇනෙයිවුලුන්දන් පත්තුවේ, හලාවත නගර සභා සීමාවේ, කොටුව පාරේ, පිහිටි වරිපනම් අංක 31 (2304) හි කොට්ටන්ඩි ශාන්ති කානි නමැති ඉඩමට බලයලත් මානක වී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 1967.08.30 දිනැති අංක 3084 දරන පිඹුරට මායිම්, උතුරට: බලයලත් මානක ආර්. එච්. ඒ. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද පිඹුරු අංක 1835 හි වරිපනම් අංක 33 (2305) න් ද, නැගෙනහිරට : කොටුව පාරෙන් ද, දකුණට : එම්. මරික්කාර්ට අයිති වරිපනම් අංක 29 (2303) දරන

ඉඩමෙන් සහ බස්නාහිරට : බැසිල් ඒ. පින්තොටට අයිති ඉඩමෙන් ද, මායිම් වූ පර්චස් දෙකයි දශම පහයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 2.50) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, සහ සියලුදේත් සමග වේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 141/160 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ටී. ටී. ප්‍රනාන්දු විසින් 1980.06.11 දින ලියා සහතික කරන ලද අංක 1366 දරන ඔප්පුව පිට බැඳුම්කරුට අයත්ව තිබෙන ලදී.

### දෙවැනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් උතුරු පිටිගල් කෝරළේ, මාදම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, ඉනිගොඩවිල ගමේ පිහිටි මුන්නේෂ්වරන් පත්තුවේ, "ඉනිගොඩවිල එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක එම්. එම්. පී. ඩී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2004.08.07 දිනැති අංක 4586 දරන පිඹුරේ ලොට් 3 සහ 4 ට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 2 න් ද නැගෙනහිරට : කොළඹ සිට හලාවත දක්වා ඇති අධිවේගී මාර්ගයෙන් ද, දකුණට : එකී පිඹුරේ ලොට් 11 න් ද (අඩි 15 ක් පළල පාර) න් සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 5 සහ 6 න් ද මායිම් වූ පර්චස් තිහ (අ. 0, රූ. 0. පර්. 30) ක් විශාල ඉඩම සමග ලොට් 11 ලෙස ලකුණු කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-699/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙමටගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විජේවර්ධන සමරසිංහ ලේකම් ආරච්චිගේ ධනුක රන්ජිත් සමරසිංහ.

2011.10.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2006.01.03 දිනැති සහ අංක 1485 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේවර්ධන සමරසිංහ ලේකම් ආරච්චිගේ ධනුක රන්ජිත් සමරසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්හත්ලක්ෂ පනස්දහස් එකසිය දහයයි ශත හැත්තෑනමය (රු. 37,50,110.79) ක මුදලක් 2010.09.06 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 37,50,110.79 ක මුදලට 2010.09.07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1485 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කොලර්ට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, නගර සභා සීමාව තුළ වැලිකඩ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, වරිපනම් අංක 411/15 බී දරන පැලැන්ගහවත්ත සහ බෙලිගහකුඹුර, කැබැල්ලගහකුඹුර සහ දිගනෙහීන් ඇල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් මැන සාදන ලද 1964.05.12 දිනැති අංක 1137 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන ඉඩම් කොටස වන උතුරට : බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් මැන සාදන ලද 1961.08.23 දිනැති අංක 800 දරන පිඹුරේ අඩි 30 ක් පළල පාරක් සඳහා වෙන් කර ඇති කොටසින් ද නැගෙනහිරට : ලොට් 5 න් ද, දකුණට : ලීලාවතී ආටිගලට අයිති මෙම ඉඩමේ ලොට් බී වලින් ද සහ බටහිරට : ලොට් 3 න් ද මායිම් වූ එකී අංක 1137 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාලත්වය ඇති ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2868/142 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1485 දරන බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-699/2

---

පීවී 8536.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "ෆ්‍රන්ට්ලයින් ටෙලිකොම් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2006.08.14" දින සංස්ථාපිත සමාගමක් වන "ෆ්‍රන්ට්ලයින් ටෙලිකොම් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ෆ්‍රන්ට්ලයින් ටෙලිකොම් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්"

නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-569

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සරත් මෝටර්ස්.
ගිණුම් අංකය : 0060 1000 2239.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අගෝස්තු මස 26 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. අයි. ආර්. වේරගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2007 දෙසැම්බර් 31 දාතම හා අංක. 1015 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සරත් මෝටර්ස්" යන ව්‍යාහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන රූපසිංහ ආරච්චිගේ චන්ද්‍රසිරි යන අය බන්ධනදායියන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නම ලක්ෂ දොළොස් දහස් දෙසිය හයයි ශත දහ හතරක (රු. 912,206.14) මුදලක් 2010 ජූලි 01 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් නම ලක්ෂ දොළොස් දහස් දෙසිය හයයි ශත දහ හතරක (රු. 912,206.14) මුදල ද 2010 ජූලි 02 වැනි දින සිට අංක 1015 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ අසූ දහසක (රු. 780,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1015 දරන එකී බැඳුම්කරය යටතේ ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (උප කාර්යාලය නාරන්වල) රන්මුතුගල ග්‍රාමයේ පිහිටි "තලගහපිල්ලෑව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2007.03.22 දාතම හා අංක 8020 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. එස්. මායාදුන්න යන අයගේ ඉඩම සහ පාර, නැගෙනහිරට : ඩී. එස්. මායාදුන්න සහ ඩී. වයි. දහනායක යන අයගේ ඉඩම්, දකුණට : ඩී. වයි. දහනායක සහ අයගේ ඉඩම සහ අංක 4438 දරන පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස සහ බස්නාහිරට : අංක 4438 දරන පිඹුරේ ලොට් අංක 01 හි ඉතිරි කොටස සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම අටයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 14.80) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක. 8020 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව C 849/14 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-694/1

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජේ. එස්. ඩැනියෙල් සහ එස්. කේ. ඩැනියෙල්.
ගිණුම් අංකය : 0036 5000 2988.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004 ජුනි 23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, නිහාල් සිල්වා මාවත, අංක 15 හි (දෙදෙනාම) පදිංචි ජෝ සිඩ්නි ඩැනියෙල් සහ වතුතන්ත්‍රිගේ සයානා කුෂිලානී ඩැනියෙල් යන අය බැඳුම්කරුවන් වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර

විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 මැයි 11 දාතම හා අංක 1493 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, 2004 මාර්තු 4 වැනි දිනට රුපියල් විසිතුන් ලක්ෂ අසූ නවදහස් එකසිය හතරයි ශත හැත්තෑතුනක (රු.2,389,104.73) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති බැවින්, එකී රුපියල් විසිතුන් ලක්ෂ අසූ නවදහස් එකසිය හතරයි ශත හැත්තෑතුනක (රු.2,389,104.73) 2004 මාර්තු 05 වැනි දින සිට වෙන්දේසි දින තෙක් පොලිය ද සහ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා, එකී බැඳුම්කර අංක 1493 මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත, නාගරික කොට්ඨාස අංක 15 (කව්ඩාන නැගෙනහිර), අත්තිඩියේ පිහිටි, කව්ඩාන, 1 වැනි හරස් වීදියේ, දැනට වරිපනම් අංක 127/21 දරන අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් මැන සාදන ලද 1988 සැප්තැම්බර් 14 දාතම හා අංක 1390 දරන පිඹුරේ නිරූපිත L-77 වශයෙන් ලකුණු කොට දක්වා ඇති, උතුරට : ලොට් L- 65 සහ L-66 ද, නැගෙනහිරට : ලොට් L- 11 (මාර්ගය සඳහා වෙන් කළ කොටස) ද, දකුණට : ලොට් L-84 ද සහ බටහිරට : ලොට් L-78 ද මායිම්වන ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 2532/86 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1390 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටක් (අක්. 0, රූඩ් 0, පර්. 8) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පිහිටි ගහකොළ, වගාවන් සහ සෑම සියළු දේ සමගය.

එසේම, බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් මැන සාදන ලද 1988 පෙබරවාරි 26 දාතම හා අංක 1334 පිඹුරේ නිරූපිත M1936/181 හි ලියාපදිංචි කළ ලොට් 11, එකී අංක 1334 පිඹුරේ නිරූපිත M1936/17 හි ලියාපදිංචි කළ ලොට් 12 (මාර්ග සඳහා වෙන් කර ඇති කොටස), එකී අංක 1334 පිඹුරේ නිරූපිත M1825/266 හි ලියාපදිංචි කළ ලොට් 1, එකී අංක 1334 පිඹුරේ නිරූපිත M1918/208 හි ලියාපදිංචි කොට ඇති ලොට් 14 (මාර්ගය සඳහා වෙන් කළ කොටස), අංක 1388 පිඹුරේ නිරූපිත M-1918/209 හි ලියාපදිංචි කොට ඇති ලොට් M (මාර්ගය සඳහා වෙන් කළ කොටස), එකී අංක 1390 පිඹුරේ නිරූපිත M1704/248 හි ලියා පදිංචි කොට ඇති ලොට් 111 (මාර්ගය සඳහා වෙනස් කළ කොටස), සහ එකී අංක 1390 පිඹුරේ නිරූපිත M1936/18 හි ලියාපදිංචි කොට ඇති ලොට් 113 (මාර්ගය සඳහා වෙන් කළ කොටස) මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-694/2

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ජයසිරි සහ ඒ. වයි. දීපානි.
ගිණුම් අංක : 0031 5001 2022.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 නොවැම්බර් මස 29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් 30 දාතම හා අංක 817 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මඩිවිලගේ ජයසිරි සහ අල්ගවත්තගේ යූරේකා දීපානි යන අය බන්ධනදායින් වශයෙන් හා එකී මඩිවිලගේ ජයසිරි යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි ලක්ෂ හැත්තෑ හතර දහස් හාරසීය හැට දෙකයි ශත තිස් එකක (රු. 2,074,462.31) මුදලක් 2010 සැප්තැම්බර් 21 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් විසි ලක්ෂ හැත්තෑ හතර දහස් හාරසිය හැට දෙකයි ශත තිස් එකක (රු. 2,074,462.13) මුදල ද, 2010 සැප්තැම්බර් 22 වැනි දින සිට අංක 817 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ අට ලක්ෂ අනූ තුන් දහස් හතලිස් දෙකයි ශත තිස් එකක (රු. 1,893,042.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 817 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඒ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ හෝමාගම නගර සභා සීමාවන් තුළ කිරිගම්පමුණුව ග්‍රාමයේ පිහිටි, "ගබෝරාලලාගේ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. වික්‍රමරත්න යන අය විසින් සාදන ලද 2007 අගෝස්තු 24 දාතම හා අංක 1533 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 3228 දරන පිඹුරේ ලොට් 1A, නැගෙනහිරට : අංක 3228 දරන පිඹුරේ ලොට් 1D සහ 1N (අඩි 20 පළල පාර), දකුණට : අංක 6718 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : එම්. පී. පෙරේරා යන අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අක්. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද,

වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1533 දරන පිඹුරට අනුවය.

එකී ලොට් A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කිරිගම්පමුණුව ග්‍රාමයේ පිහිටි "ගබෝරාලලාගේ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඊ. විජේසූරිය යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු 09 දාතම හා අංක. 3228 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 A, නැගෙනහිරට : ලොට් 1D සහ 1N (අඩි 20 පළල පාර) දකුණට : අංක 6718 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : එම්. පී. පෙරේරා යන අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අක්. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක. 3228 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව N190/207 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-694/3